සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - I

13 ශ්‍රේණිය

කාලය පැය 02 යි.

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

(01) අන්තර් වර්තී පුද්ගල සන්නිවේදනය යනු,
(1) සන්නිවේදන සබඳතාවේ මට්ටම දක්වන්නකි.
(2) සීමිත පිරිසක් සමඟ දක්වන අන්තර් සම්බන්ධතාවකි.
(3) ග්‍රාහකයින් දැනුවත් කිරීමේ හා පෙළඹවීමේ සන්නිවේදන විධික්‍රමයකි.
(4) එකම පුද්ගලයෙකු තුළ සිදුවන සන්නිවේදන හා ග්‍රාහක භූමිකා හුවමාරුවකි.
(5) ප්‍රතිපෝෂණයක් බලාපොරොත්තුවෙන් සිදුකරන තොරතුරු ලබා දීමකි. (........)

(02) විශාල සම්මන්ත්‍රණ ශාලාවක දේශනයක් පැවැත්වීමට පැමිණෙන කථිකයා තමන්ගේ පහසුව සඳහා ඇති සන්නිවේදන උපකරණ පිළිබඳව විමසයි. ඔහුට ප්‍රධාන වශයෙන්ම අවශ්‍යය වන්නේ,
(1) බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍රයකි. (2) ශබ්ද විකාශන උපකරණයකි.
(3) උහිස් ප්‍රක්ෂේපණ උපකරණයකි. (4) විනිවිදක ප්‍රක්ෂේපණ උපකරණයකි.
(5) රැහැන් රහිත මයික්‍රපෝනයකි. (........)

(03) සන්නිවේදකයාගේ සිට ග්‍රාහකයා දක්වා පණිවිඩය ගලා යාමේදී අතරමඟ විවිධ ව්‍යාකූලතාවයන්ට පත්වීමට ද ඉඩ තිබේ. මේ තත්ත්වය පෙන්වා දුන්නේ,
(1) හැරල්ඩ් ලැස්වෙල් ය. (2) ඬේවිඩ් කේ. බර්ලෝය. (3) විල්බර් ශ්‍රාම් ය.
(4) ෂැනොන් හා වීවර් ය. (5) ඇරිස්ටෝටල් ය. (........)

(04) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය, වාචික සන්නිවේදනය සහ ජනසන්නිවේදනය අනුපිළිවෙලින් දැක්වෙන්නේ,
(1) තනිවම ගීතයක් රසවිඳීම, එය යමෙකුට පැවසීම සහ එම ගීතය රූපවාහිනියෙන් නැරඹීම මගිනි.
(2) ගීතයක් ගැන අන්‍යයන්ට පැවසීම, තනිවම එය ගැයීම සහ ගුවන්විදුලියෙන් එම ගීතය ශ්‍රවණය කිරීම.
(3) ගීතයක විචාරයක් පුවත්පතක දැකීම, ගීතය තනිවම ගැයීම සහ යහළුවන්ට එම ගීතය පිළිබඳව පැවසීම මගිනි.
(4) රූපවාහිනියෙන් ගීතයක් නැරඹීම, පිරිසකට එම ගීතය පිළිබඳ කියා දීම සහ යහළුවන් සමඟ එම ගීතය ගැයීම මගිනි.
(5) ගීතය පිළිබඳව නව අදහස් පහල වීම,එම අදහස් යහළුවන්ට පැවසීම සහ ඒවා ලියා තැබීම.(........)

(05) මිනිසා සිය දෛනික කටයුතු සඳහා භාවිත කරන්නේ,
(1) ප්‍රාදේශීය භාෂාවකි. (2) ජීව භාෂාවකි. (3) මාතෘ භාෂාවකි.
(4) උප භාෂාවකි. (5) ජාතික භාෂාවකි. (........)

(06) ගසක ඇති දොඩම්වලින් පරිභෝජනයට අවශ්‍යය ප්‍රමාණය පමණක් නෙළා ගන්නා ලෙස වැඩිහිටියෝ ළමයිනට උපදෙස් දුන්හ." මෙම ප්‍රකාශයේ අන්තර්ගත වඩාත් අදාළ වන්නේ,
(1) සමූහ සන්නිවේදනයට ය. (2) පරිසර සන්නිවේදනයට ය.
(3) තිරසර සන්නිවේදනයට ය. (4) කෘෂි සන්නිවේදනයට ය.
(5) ප්‍රජා සන්නිවේදනයට ය. (........)

(07) ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය හා ජනසන්නිවේදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් දැකිය හැකි ප්‍රධාන ගැටළුවක් වන්නේ, සප්‍රමාණික වූ ද, සප්‍රාණවත් වූ ද, සන්නිවේදන විචාරයක් බිහි වී නොතිබීම ය." ඉහත සඳහන් ආකාරයේ වාක්‍ය රටා වඩාත් යෝග්‍ය මාධ්‍ය වන්නේ,

(1) ගුවන් විදුලිය යි. (2) පුවත් පත යි. (3) රූපවාහිනිය යි.
(4) සිනමාව යි. (5) පෝස්ටරය යි. (........)

(08) අතිශය සීමිත හා පමා වූ ප්‍රතිපෝෂණය යන්න බහුලව ම දක්නට ලැබෙන්නේ,

(1) පුද්ගලාන්තර සන්නිවේදනයේ දී ය. (2) අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ දී ය.
(3) ජනසන්නිවේදනයේ දී ය. (4) කාණ්ඩායම් සන්නිවේදනයේ දී ය.
(5) නිර්වාචික සන්නිවේදනයේ දී ය. (........)

(09) සමූහ සන්නිවේදනය තුළින් දැකිය නොහැකි අංග ලක්ෂණයක් වන්නේ,

(1) පිරිස අභිමුඛව අමතන්නෙක් සිටීම.
(2) ග්‍රාහක පිරිසක් සිටීම.
(3) තාක්ෂණික මෙවලම් භාවිතා කළ හැකි වීම.
(4) දුරකථනය භාවිතා කළ හැකි වීම.
(5) ප්‍රදීපාගාර උපකරණ යොදාගැනීම. (........)

(10) සන්නිවේදන ලෝකයේ මානව සන්නිවේදනය මෙන්ම සත්ව සන්නිවේදනය ද දැකිය හැකි වේ. මෙම සන්නිවේදන ක්‍රම 2 ක තුළම දැකිය හැකි පොදු ලක්ෂණයක් වන්නේ,

(1) අවශ්‍යතාවයක් මත සන්නිවේදනයේ යෙදීම යි.
(2) භාෂාවක් භවිතා කිරීමයි.
(3) ද්විරූපතාවක් දැකගත හැකි වීමයි.
(4) පරිනාමනය වන සාධකයක් වීමයි.
(5) විවිධ මාධ්‍යයන් භාවිතා කිරීමයි. (........)

(11) "උපදෙස් සම්පාදනය" නමැති සන්නිවේදන කාර්යයට වඩාත් ගැලපෙන නිදර්ශනය තෝරන්න.

(1) පරිගනකයේ ඓතිහාසික විකාශය සිදුවූ අයුරු පැහැදිලි කිරීම.
(2) පරිගණකයෙන් මුද්‍රණ පිටපතක් ලබා ගන්නා අයුරු පැහැදිලි කිරීම.
(3) පරිගණකය මගින් ලේඛනය වේගවත් වූ අයුරු පැහැදිලි කිරීම.
(4) පරිගණක ආශ්‍රිත මුද්‍රණයේ ආකර්ෂණීය බව පැහැදිලි කිරීම.
(5) පරිගණකය නිසා මිනිස් ක්‍රියාකාරකම්වල සිදු වූ වෙනස පැහැදිලි කිරීම. (........)

(12) පුවත්පතක එළ වූ ප්‍රධාන ප්‍රවෘත්තියක භාෂාමය දෝෂ රාශියක් ප්‍රධාන සංස්කාරකවරයා දුටුවේය. ඔහු එම කාරණය ගැන විමසීමට වඩාත්ම ඉඩ ඇත්තේ,

(1) ප්‍රවෘත්ති සංස්කාරකවරුන්ගේ ය. (2) සෝදුපත් බලන්නන්ගෙන් ය.
(3) පිටු සැකසුම්කරුවන්ගෙන් ය. (4) අක්ෂර සංයෝජකයන්ගෙන් ය.
(5) ප්‍රවෘත්ති වාර්තාකරුවන්ගෙන් ය. (........)

(13) යම් කරුණක් මතකයෙහි තබා ගැනීමේදී වැදගත් සාධකයක් නොවන්නේ,

(1) පරිකල්පනයයි. (2) ආවර්ජනයයි. (3) අභ්‍යාසයයි.
(4) අවධාරණයයි. (5) භාවිතයයි. (........)

(14) තොරතුරු ආකේතකරණය හා විකේතකරණය සන්නිවේදන ක්‍රියාවලියේදී අත්‍යවශ්‍ය අංගයක් බව ප්‍රථම වරට ඉදිරිපත් කරන ලද්දේ,

(1) ෂැනොන් හා වීවර් ය. (2) ඇලෙක්සැන්ඩර් ග්‍රැහැම්බෙල් ය.
(3) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය. (4) මාෂල් මැක්ලුහන් ය.
(5) විල්බර් ශ්‍රාම් ය. (........)

(15) ජනමාධ්‍ය ආයතනයක ප්‍රතිපත්ති සකස් කරනු ලබන්නේ,
   (1) ග්‍රාහකයින් ය.   (2) ජනමාධ්‍යවේදීන් ය.   (3) දැන්වීම්කරුවන් ය.
   (4) හිමිකරුවන් ය.   (5) දොරටුපාලකයින් ය.   (........)

(16) ජනමාධ්‍ය මගින් සිදුවන සන්නිවේදනයෙහි දී අනිවාර්යය සාධකයක් නොවන්නේ,
   (1) දොරටුපාල කාර්යයයි.   (2) තාක්ෂණික විධික්‍රම භාවිතයයි.
   (3) ද්විමාර්ගික බවකින් යුක්ත වීමයි.   (4) පොදු සංදේශ විසරණයයි.
   (5) ධූරාවලියක් සහිත ආයතනික රටාවයි.   (........)

(17) සන්නිවේදනය පිළිබඳ වඩා නිවැරදි අර්ථකතනය කුමක්ද?
   (1) තොරතුරු සබඳතාවයකි.
   (2) තොරතුරු සම්ප්‍රේෂණය හා ලබාගැනීමේ ක්‍රියාවලියකි.
   (3) පොදු ජන සන්නිවේදන හා තොරතුරු මාධ්‍යයකි.
   (4) විවිධ සම්ප්‍රේෂණ උපකරණ වල අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වයකි.
   (5) ප්‍රායෝගික අන්තර් ක්‍රියාවලියකි.
(........)

(18) "අප්‍රිකාවේ තොරතුරු අප්‍රිකානු ඇසකින් ලෝකයට පෙන්වීම වැදගත්" වන බව රාජ්‍ය නායිකාවක් පැවසුවා ය. ඇයගේ ප්‍රකාශය අනුව කිසියම් රටක සංවර්ධනයට අදාළ තොරතුරු ලෝකයට වාර්තා කළ යුත්තේ,
   (1) එම රට පිළිබඳ සුභවාදී දෘෂ්ටියකිනි.
   (2) ස්වදේශීය ජනමාධ්‍ය නාලිකා තුළිනි.
   (3) රටේ සමාජ සංස්කතික සාධක පිළිබඳ අවබෝධයකිනි.
   (4) එම රටේ ප්‍රතිරූපයට හානිකර නොවන ආකාරයෙනි.
   (5) රටේ සංවර්ධන ව්‍යාපෘති ප්‍රවර්ධනය වන අයුරිනි.   (........)

(19) කෙටි කාලීන ලාභ අපේක්ෂාවෙන් තොරව, එක්තරා වෙළඳ ආයතනයක් ඔබේ පාසලේ මාධ්‍ය සමාජයට අඩුපාඩුවක්ව පැවති පරිගණක යන්ත්‍රයක් පරිත්‍යාග කළේය. මෙය මහජන සම්බන්ධතා ක්‍රියාවලියට අනුව,
   (1) අනුග්‍රාහකත්වය දැක්වීමකි.   (2) පරිත්‍යාගශීලීත්වය දැක්වීමකි.
   (3) අධ්‍යාපනය සඳහා සහයෝගය දැක්වීමකි.   (4) පාසලෙහි සංවර්ධනයට දායකවීමකි.
   (5) කීර්තිය අපේක්ෂා කිරීමකි.   (........)

(20) සංවර්ධන ව්‍යාපෘතියක සාර්ථක අරමුණු සාධනය සඳහා සුදුසුම වාර්තාකරණ ක්‍රමය වන්නේ,
   (1) ආරම්භක වාර්තාකරණයයි.   (2) අවසන් වාර්තාකරණයයි.
   (3) හදිසි වාර්තාකරණයයි.   (4) අඛණ්ඩ වාර්තාකරණයයි.
   (5) අවස්ථා පාදක වාර්තාකරණයයි.   (........)

(21) ඥාන ගවේෂණය පිළිබඳ අදහස් කිහිපයක් පහත දැක්වේ. ඉන් සදොස් අදහස තෝරන්න.
   (1) ඥාන ගවේෂණය ඓතිහාසික සිද්ධියකි.
   (2) ඥාන ගවේෂණයේදී විවිධ ශිල්ප ක්‍රම භාවිතා කෙරෙයි.
   (3) ඥාන ගවේෂණය බල ක්ෂේත්‍රයට අභියෝගයක් වේ.
   (4) ඥාන ගවේෂණය න්‍යායික ගවේෂණයේ ප්‍රතිඵලයක් පමණි.
   (5) ඥාන ගවේෂණය යනු ලෝකය අනාවරණය කර ගැනීමයි.   (........)

(22) කපුටා සහ කේජු කැල්ල පිළිබඳ කතා පුවත පන්තියේ ඉදිරිපත් කළ ගුරුවරයා එහි වඩාත් සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගන ලෙස සිසුන්ට කීවේ ය. ගුරුවරයා මෙහිදී අපේක්ෂා කරන ලද්දේ සිසුන් තුළ ඇති,
   (1) චිත්‍ර කලාව පිළිබඳ ප්‍රවීණත්වය මැන බැලීම යි.
   (2) නිර්මාණාත්මක සන්නිවේදන කුසලතා හඳුනාගැනීමයි.
   (3) යමක් නිශ්චිත ලෙස හඳුනාගැනීමේ හැකියාව දැනගැනීමයි.

(4) කලාව පිළිබඳ අවබෝධය නිරීක්ෂණය කිරීමයි.
(5) ජනකතා පිළිබඳ අවබෝධය හඳුනාගැනීමයි. (........)

(23) ගැටුම් කළමණාකරණය මගින් උත්සාහ ගන්නේ,
(1) ගැටුම වෙනත් දිශාවන්ට හැරවීම.
(2) ගැටුමේ ප්‍රචණ්ඩත්ව හා විනාශකාරී මට්ටම අවම කිරීම.
(3) අදාළ පුද්ගලයින්ට තාවකාලික විසඳුමක් ලබා දීම.
(4) ගැටුමේ තීව්‍රතාව ගැන උපදෙස් දීම.
(5) ගැටුම ව්‍යාප්ත වීමට කටයුතු කිරීම. (........)

(24) සමාජය හා සන්නිවේදනය අතර පවතින සබඳතාව වඩාත් හොඳින් පැහැදිලි කෙරෙන වාක්‍ය වන්නේ,
(1) "සමාජය හා සන්නිවේදනය අතර ඇත්තේ ධනාත්මක සබඳතාවකි." යන්නය.
(2) "සමාජය හා සන්නිවේදනය අතර ඇත්තේ සංකේතාත්මක සබඳතාවයකි." යන්නය.
(3) "සන්නිවේදනය සමාජයේ පෙරගමන්කරුවෙකි." යන්නය.
(4) "සන්නිවේදනය මගින් සමාජය නිර්නය කරනු ලැබේ." යන්නය.
(5) "සමාජය මගින් සන්නිවේදනය නිර්ණය කරනු ලැබේ." යන්නය. (........)

(25) රූපවාහිනිය නරඹන සමහර දරුවන්ගේ හැසිරීම් රටා එම මාධ්‍යයේ හමුවන විවිධ චරිතවල අනුකරණයන් බව පර්යේෂණයකින් පෙනී ගියේ ය. මෙවැනි තත්ත්වයක් වඩා හොඳින් විග්‍රහ වන්නේ,
(1) සහානුභූති සංකල්පය ඇසුරිනි. (2) දෙපියවර සංකල්පය ඇසුරිනි.
(3) නිදහස් මාධ්‍ය සංකල්පය ඇසුරිනි. (4) සමාජ වගකීම් සංකල්පය ඇසුරිනි.
(5) සමාජානුයෝජන සංකල්පය ඇසුරිනි. (........)

(26) ශ්‍රවණ ක්‍රියාවලිය යනු ප්‍රගුණ කළහැකි ශක්‍යතාවයකි. එහි අනුපිළිවෙල වන්නේ,
(1) ඇසීම, තේරුම්ගැනීම, ඇගයීම හා ප්‍රතික්‍රියා දැක්වීම ය.
(2) තේරුම් ගැනීම, ඇසීම, ඇගයීම හා ප්‍රතික්‍රියා දැක්වීම ය.
(3) ඇසීම, ඇගයීම, තේරුම් ගැනීම හා ප්‍රතික්‍රියා දැක්වීම ය.
(4) තේරුම් ගැනීම, ඇසීම, ප්‍රතික්‍රියා දැක්වීම හා ඇගයීම ය.
(5) ඇසීම, තේරුම් ගැනීම, ප්‍රතික්‍රියා දැක්වීම හා ඇගයීම ය. (........)

(27) ජනමාධ්‍ය වලින් ඉදිරිපත් වන සංදේශ විවිධාකාර ලක්ෂණ වලින් යුක්ත වේ. ඒවා නිසි පරිදි අර්ථකතනය කරගැනීමට හා අවබෝධ කරගැනීමට හැකි වන්නේ පුද්ගලයා තුළ පවතින මාධ්‍ය,
(1) සංජානන ශක්තියෙනි. (2) විචාරාත්මක ඥානයෙනි.
(3) සාක්ෂරතා ඥානයෙනි. (4) ඇගයීම් ශක්තියෙනි.
(5) විශ්ලේෂණාත්මක ඥානයෙනි. (........)

(28) සමාජයක විකල්ප මාධ්‍ය භාවිතය උත්සන්න වීමට මූලික වශයෙන් බලපාන්නේ,
(1) අධිපතිවාදී මාධ්‍ය ප්‍රවණතා තීව්‍ර වීමය.
(2) නිදහස් මාධ්‍ය ප්‍රවණතා පැතිර යෑමය.
(3) සංවර්ධනාභිමුඛ මාධ්‍ය භාවිතය වර්ධනය වීමයි.
(4) නව මාධ්‍ය ව්‍යාප්ත වීමය.
(5) සාක්ෂරතාව වර්ධනය වීමය. (........)

(29) පොලිස් මහජන සම්බන්ධතා කාර්යයට අයත් නොවන්නේ,
(1) අපරාධ නිවාරණ ක්‍රම පිළිබඳව ජනතාව දැනුවත් කිරීමය.
(2) ආපදා අවස්ථාවලදී මහජනයාට පිහිට වීමය.

(3) උත්සව අවස්ථාවලදී මහජන අවශ්‍යතා ඉටු කිරීමය.
(4) රාජ්‍ය නිලධාරීන්, ප්‍රභූ පිරිස් ආරක්ෂා කිරීමය.
(5) මාර්ග නීති පිළිබඳ පාසල් වැඩමුළු සංවිධානය කිරීමය. (........)

(30) මෙරට ජනමාධ්‍ය ඔස්සේ ජනප්‍රිය සංස්කෘතිකාංග සීමාව ඉක්මවා ග්‍රාහකගත කිරීම නව ප්‍රවණතාවයක් ලෙස දැකගත හැකිය. එය,
(1) තාරුණ්‍යය ප්‍රබෝධමත් කිරීමකි.
(2) ජනමාධ්‍ය විවිධාංගීකරණයට ලක් කිරීමකි.
(3) ග්‍රාහක අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකි.
(4) අන්තර් සංස්කෘතිය පිළිබඳව අධ්‍යනය කිරීමකි.
(5) සංවර්ධන සන්නිවේදන ගැටලුවකි. (........)

(31) රූපවාහිනිය සමාජය තුළ වඩාත් ජනප්‍රිය මාධ්‍යය බව වෙළඳපොල සමීක්ෂණ වාර්තා මඟින් හෙළිදරව් වී ඇත. එවැනි ජනප්‍රියත්වයකට වඩාත් බලපාන වැඩසහටන් කාණ්ඩය තෝරන්න.

A - ප්‍රවෘත්ති වැඩසටහන්
B - ටෙලිනාට්‍ය
C - රියැලිටි වැඩසටහන්
D - සංගීතමය වැඩසටහන්
E - ආගමික වැඩසටහන්
F - ජ්‍යොතිෂ වැඩසටහන්
G - ළමා වැඩසටහන්

(1) A, B, C, D (2) A, B, E, F (3) B, C, F, G
(4) B, C, D, E (5) C, D, F, G (........)

(32) මාධ්‍ය සාක්ෂරතාව තුළින් මූලිකවම ප්‍රවර්ධනයට උත්සාහ කරන්නේ,
(1) සංදේශ විචාරය කිරීමේ හැකියාව යි. (2) සංදේශ නිර්මාණය කිරීමේ හැකියාව යි.
(3) සංදේශ විනිශ්චය කිරීමේ හැකියාව යි. (4) සංදේශ ග්‍රහණය කිරීමේ හැකියාව යි.
(5) සංදේශ අර්ථකථනය කිරීමේ හැකියාව යි. (........)

(33) විවිධ ප්‍රදේශවල විසිරී සිටින සංස්කෘතීන් එකට එකතු වීම,
(1) ජනප්‍රිය සංස්කෘතියයි. (2) ගෝලීය සංස්කෘතියයි. (3) බහුජන සංස්කෘතියයි.
(4) අපරදිග සංස්කෘතියයි. (5) පෙරදිග සංස්කෘතියයි. (........)

(34) ගැටුම් කළමණාකරුවන් ගැටුම් සම්පතක් ලෙස දකින්නේ,
(1) ගැටුම සමාජයට ප්‍රවෘත්ති ජනනය කරන නිසා ය.
(2) ගැටුම සමාජ විපරිවර්ථනයන්ට අත්‍යවශ්‍යය නිසා ය.
(3) ගැටුම් තුළින් ඇතැම් පාර්ශවයන් වාසි අත්පත් කරගන්නා නිසා ය.
(4) ගැටුම් මතුවීම තුළින් ඒවා කළමනාකරණයට ඉඩ ලැබෙන නිසා ය.
(5) ගැටුම් සමාජයට සජීවී බවක් ලබාදෙන නිසා ය. (........)

(35) ශ්‍රී ලංකාව වැනි කුඩා භූමි ප්‍රදේශයක් තුළ වුවද උපභාෂා වර්ධනයට හේතු වී තිබෙන්නේ,
(1) ජීවන චරියාවන්ගේ වෙනස්කම් ය.
(2) ආගමික හා සංස්කෘතික විවිධත්වයන් ය.
(3) වෙනත් භාෂාවන්ගේ බලපෑම් වලට ලක්වීම ය.
(4) ප්‍රාදේශීයව අනන්‍ය ලෙස වර්ධනය කරගත් වචනමාලාවක් පැවතීම ය.

(5) මේ සියලු හේතුන්ගේ බලපෑම නිසා ය. (........)

(36) මාධ්‍ය සාක්ෂරතාව හා සම්බන්ධ කුසලතාවක් ලෙස සැලකීමට වඩාත් අසීරු වන්නේ මාධ්‍ය අන්තර්ගතය,

(1) පරිහරණය කිරීමට ඇති අවබෝධය යි. (2) නිර්මාණය කිරීමට ඇති හැකියාව යි.

(3) ඇගයීමට ඇති ශක්‍යතාව යි. (4) විශ්ලේෂණයට ඇති දක්ෂතාව යි.

(5) පරිභෝජනයට ඇති රුචිකත්වය යි. (........)

(37) රියැලිටි (Reality) රූපවාහිනී වැඩ සටහනන්වලට ආවේණික ලක්ෂණයක් වන්නේ,

(1) සජීවී වැඩසටහන් වීම ය. (2) අධික පිරිවැයක් සහිත වැඩසටහන් වීම ය.

(3) අධික ජනාකර්ශණීය වැඩසටහන් වීම ය. (4) සංස්කරණය හා තිර පිටපත් රහිත වීම ය.

(5) මුළුමනින්ම තාරුණ්‍ය වැඩටසහනක් වීම ය. (........)

(38) ජනප්‍රිය සංස්කෘතිය හඳුනාගැනීමේ ලක්ෂණයක් නොවන්නේ,

(1) ජනප්‍රිය සංස්කෘතිය, ජනප්‍රිය කළ සංස්කෘතියකි.

(2) ජනප්‍රිය සංස්කෘතිය වාණිජ අවශ්‍යතා ඉටු කරන්නකි.

(3) ජනප්‍රිය සංස්කෘතිය මහා පරිමාණ කලා නිෂ්පාදන වල ඵලයකි.

(4) ජනප්‍රිය සංස්කෘතිය ක්‍රමික සංස්කෘතික විකාශනයකි.

(5) ජනප්‍රිය සංස්කෘතිය තුළ තරු සංකල්පය ප්‍රබල ලක්ෂණයකි. (........)

(39) පහත ක්‍රියාකාරකම් අතුරින් මහජන සම්බන්ධතා ක්‍රියාකාරකමක් නොවන්නේ,

(1) පාසලේ සංවර්ධන සමිති රැස්වීම.

(2) පවුලක් විසින් සූදානම් කරනු ලබන විවාහ මංගල උත්සව සාදය.

(3) ආයතනයක කාර්ය මණ්ඩල රැස්වීම.

(4) ආයතනයක කාර්යයන් හා සේවාවන් දැක්වෙන සංඥා භාවිතය හා පරිසර අලංකාර ක්‍රියාත්මක කිරීම.

(5) අළුත් අවුරුද්ද වෙනුවෙන් සියලුම පාරිභෝගිකයන් සහ පාර්ශවකරුවන් වෙත සුභ පැතුම් යැවීම.

(........)

(40) සංස්කෘතිය යනු සමාජය විසින් ඉගෙන එක් රැස් කරගන්නාවූත්, බෙදා හදාගෙන පරම්පරාවෙන් පරම්පරාවට ගෙනයනු ලැබූත් අදහස්, උදහස් හා පුරුදු ය. ඉහත නිර්වචන ඉදිරිපත් කරන ලද්දේ,

(1) මාග්‍රට් මීඩ් ය. (2) රැල්ෆ් ලින්ටන් ය. (3) මැලිනොවුස්කි ය.

(4) ඩී. එච්. කුලි ය. (5) විල්බර් ශ්‍රාම් ය. (........)

(41) ගැටුම් කළමනාකරණ ක්‍රියාදාමයකදී ජය ජය මාදිලිය සාර්ථක වීම සඳහා,

(1) දෙපාර්ශවයම එකිනෙකාගේ ජයග්‍රහණ සඳහා කැපවිය යුතුය.

(2) දෙපාර්ශවයම යම් කැපකිරීමක් කර මධ්‍යස්ථ ජයග්‍රහණයකට සූදානම් විය යුතුය.

(3) දෙපාර්ශවයම එදිරිවාදිකම් නැතිකර තෙවන පාර්ශවයේ විසඳුම පිළිගත යුතුය.

(4) ගැටුමෙන් පරාජය වී සිටින පාර්ශවය වෙත කරුණාවන්තව සැලකීමට ජයග්‍රාහක පාර්ශවය ඉදිරිපත් විය යුතුය.

(5) දෙපාර්ශවයම ගැටුම් අවස්ථා මඟහැර යාමට වගබලා ගත යුතුය. (........)

(42) ඵලදායී සන්නිවේදනයක් සඳහා අවම වැදගත්කමක් දක්වන්නේ,

(1) ග්‍රාහක ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධය යි.

(2) සන්දර්භය අනුව පණිවිඩය විශ්ලේෂණය කිරීමයි.

(3) සංස්කෘතිය ගැන අවධානය යොමු කිරීමයි.

(4) සමාන අත්දැකීම් පසුතල සහිත වීමයි.

(5) සන්නිවේදන තාක්ෂණය පිළිබඳ අවබෝධයක් තිබීමයි. (........)

(43) වියලි කලාපයේ ග්‍රාමීය ප්‍රදේශවලට සූර්යකෝෂ මඟින් විදුලිය ජනනය කළ හැකි ක්‍රම හඳුන්වාදීමේ ව්‍යාපෘතියකදී යොදාගත හැකි වඩාත් සුදුසු සන්නිවේදන ක්‍රමෝපාය වන්නේ,

(1) නව මාධ්‍ය යොදාගැනීම යි. (2) ගුවන් විදුලි වැඩසටහන් විසුරුවා හැරීමයි.

(3) ගෙන් ගෙට ගොස් පැහැදිලි කර දීමයි. (4) පුවත්පත් අතිරේක එළ කිරීමයි.

(5) පත්‍රිකා, පෝස්ටර් මගින් දැනුවත් කිරීමයි. (........)

(44) සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) කථන සන්නිවේදනය තුළ වාචික සන්නිවේදන විධි ඇතුළත් ව තිබිය හැකිය.

(2) ලිඛිත සන්නිවේදනය තුළ නිර්වාචික සන්නිවේදන විධි ඇතුළත් ව තිබිය හැකිය.

(3) කථන සන්නිවේදනය තුළ නිර්වාචික සන්නිවේදනය විධි ඇතුළත් ව තිබිය හැකිය.

(4) ලිඛිත සන්නිවේදනය තුළ වාචික සන්නිවේදනය විධි ඇතුළත් ව තිබිය හැකිය.

(5) ලිඛිත සන්නිවේදනය තුළ කථන සන්නිවේදනය විධි ඇතුළත් ව තිබිය හැකිය. (........)

(45) ස්වසංකල්පය පිළිබඳව ප්‍රකාශය කිහිපයක් පහත දැක්වේ.

A - උපතින් පුද්ගලයා සතුවන්නකි.

B - අන් අය සමඟ අන්තර් ක්‍රියාවෙහි යෙදීමේ ප්‍රතිපත්තියක් ලෙස නිර්මාණය වන්නකි.

C - සන්නිවේදන ක්‍රියාවලිය හේතුකොටගෙන වර්ධනය වන්නකි.

ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.

(4) A හා C පමණි. (5) B හා C පමණි. (........)

(46) පන්ති කාමරයේදී "ප්‍රතිපෝෂණය" පිළිබඳව සිසුන් අතර සාකච්ඡාවක් ඇති විය. එහිදී ඉදිරිපත් වූ අදහස් කීපයක් වන්නේ,

A - යම් කරුණක් පිළිබඳව අදහස් දැක්වීම ය.

B - යම් සිද්ධියක් පිළිබඳව අවබෝධයකින් අදහස් දැක්වීම ය.

C - යමක් අවබෝධ කරගෙන එයට යමක් එකතු කර අදහස් දැක්වීම ය.

D - යම් කරුණක් පිළිබඳ මත විමර්ශනය කරමින් අදහස් දැක්වීම ය.

E - මෙයින් නිවැරදි වන්නේ,

(1) A හා B පමණි. (2) A හා D පමණි. (3) B හා C පමණි.

(4) C හා D පමණි. (5) A, B, C, D යන සියල්ලම ය. (........)

(47) සංවර්ධන ව්‍යාපෘති සකස් කිරීමෙහිලා අවධානය යොමු විය යුතු කරුණු 5 ක් පහත දැක්වේ.

A - ව්‍යාපෘතියට අදාළ කාල රාමුව B - ව්‍යාපෘතියට අදාළ ඇස්තුමේන්තුව

C - ව්‍යාපෘතියට අදාළ ප්‍රදේශයේ භූ ගෝලීය සාධක

D - ව්‍යාපෘතියට අදාළ ඉලක්ක ප්‍රජාව E - ව්‍යාපෘතියට අදාළ අයිතම

ඉහත කරුණුවල වැදගත්කම අනුව ඒවායේ අනුපිළිවෙල විය යුත්තේ,

(1) D, E, C, B හා A ය. (2) A, B, C, D හා E ය. (3) A, D, C, E හා B ය.

(4) B, A, C, E හා D ය. (5) C, D, B, E හා A ය. (........)

(48) පහත සඳහන් භාෂා කාණ්ඩවලින් ජීව භාෂා ගණයට අයත් නොවන්නේ මොනවාද?

(1) සිංහල ඉංග්‍රීසි සංස්කෘත (2) ඉතාලි රුසියානු දෙමළ

(3) පාලි සංස්කෘත ලතින් (4) ප්‍රංශ හින්දි ස්පාඤ්ඤ

(5) දෙමළ පාලි ලතින් (........)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය - II

**13 ශ්‍රේණිය** | **කාලය පැය 03 යි.**

- ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.

---

01. (i) ගුවන් විදුලි මාධ්‍යයේ විශේෂතා දෙකක් නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 4)
    (ii) සන්නිවේදන ක්‍රියාවලිය තුළ හඳුනාගෙන ඇති මූලිකාංග 4 ක් දක්වා ඒවා පැහැදිලි කරන්න.(ල. 6)
    (iii) පුවත්පත් වාර්තා සඳහා භාෂාව භාවිත කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු 5 ක් දක්වා ඒවායේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 10)

02. (i) ජනප්‍රිය සංස්කෘතියේ මූලික ලක්ෂණ 4 ක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 4)
    (ii) නිර්වාචික සන්නිවේදනය පිළිබඳ කෙටි හැඳින්වීමක් කර ඒ සඳහා උදාහරණ 6 ක් ලියන්න. (ල. 6)
    (iii) පුරවැසි මාධ්‍යවේදය යනු කුමක්දැයි හඳුන්වා එහි ලක්ෂණ 4 ක් විස්තර කරන්න. (ලකුණු 10)

03. (i) ජීව භාෂාවකට අයත් ලක්ෂණ 4 ක් නම් කරන්න. (ලකුණු 2)
    (ii) සමූහ සන්නිවේදනය හා ජනසන්නිවේදනය අතර වෙනස්කම් 4 ක් විස්තර කරන්න. (ලකුණු 8)
    (iii) සන්නිවේදනයේ මූලික අරමුණු 4 ක් නම් කර පැහැදිලි කරන්න. (ලකුණු 4)
    (iv) ගෝලීයකරණය නිසා ශ්‍රී ලාංකික සමාජය තුළ සිදුවන වෙනස්කම් ක්ෂේත්‍ර 2 ක් ඔස්සේ විස්තර කරන්න. (ලකුණු 6)

04. (i) සරල මානසික පීඩාවලින් මිදීමට උපයෝගී කර ගත හැකි ක්‍රියාමාර්ග 4 ක් නම් කර ඉන් 2 ක් පැහැදිලි කරන්න. (ලකුණු 4)
    (ii) ගෘහය තුළ සාමය හා සහජීවනය බිඳ වැටුන විට ඇති විය හැකි අහිතකර ලක්ෂණ 4 ක් ලියන්න. (ලකුණු 4)
    (iii) ප්‍රචණ්ඩත්වය රූපවාහිනී මාධ්‍ය තුළ නිරූපණය වන ආකර 2 ක් පැහැදිලි කරන්න. (ලකුණු 4)
    (iv) ආයතනයක අභ්‍යන්තර ගැටුමක් සමථයකට පත් කිරීම සඳහා ඔබ යෝජනා කරන මහජන සම්බන්ධතා විධික්‍රම 4 ක් නම් කර ඉන් 2 ක් පැහැදිලි කරන්න. (ලකුණු 8)

05. (i) සංවර්ධනය වෙමින් පවතින රටක් සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී භාවිතයට නොගත යුතු සංකල්ප ලෙස හැඳින්වෙන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න. (ලකුණු 2)
    (ii) සංවර්ධන හා සන්නිවේදනය අතර පවතින සබඳතාව විග්‍රහ කළ පුරෝගාමියෙක් වන එවරට් එම්. රොජර්ස්ගේ මතවාදය කරුණු 2 ක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 8)
    (iii) සංවර්ධන සන්නිවේදන වැඩසටහන්වලදී ප්‍රජා සහභාගීත්වය උපරිමයෙන් ලබාගැනීමට අනුගමනය කළ හැකි විධි ක්‍රම 4 ක් විස්තර කරන්න. (ලකුණු 10)

06. (i) මාධ්‍ය සාක්ෂරතාව යන්න යුරෝපා කොමිසමට අනුව නිර්වචනය කර ඇත්තේ කෙසේද?(ලකුණු 4)
    (ii) මාධ්‍ය සාක්ෂරතාවයට අදාළවන කුසලතා 4 නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 6)
    (iii) ජනමාධ්‍යට අනුව සකස් කරගන්නා පුද්ගල න්‍යාය පත්‍රය නිසා පුද්ගලයන්ට හා සමාජයට යථාර්ථවාදී ලෙස තම සමාජය විනිවිද දකින්නට අවකාශය ලැබේද නැද්ද යන වග පැහැදිලි කරන්න. (ලකුණු 10)